මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය 2014

# Primary Piriven Mid Year Term Test - 2014

5 වසර / Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**සංස්කෘත**
**Sanskrit**

කාලය : පැය තුනයි
Time : Three hours

**I** කොටසේ ප්‍රශ්න **සියල්ලට ම ද, II** කොටසින් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

1. නිවැරදි වරණය තෝරා එහි අංකය වටේ රවුමක් අඳින්න. නැතහොත් අංකය ලියා දක්වන්න.

(i) क च ट त प යනු

(1) නාමින් ය. (2) හ්‍රස්ව ය. (3) වර්ගමූලාක්ෂර ය. (4) ඝෝෂ ය.

(ii) අඝෝෂ පමණක් අයත් පේළිය වන්නේ

(१) प फ ब भ म (२) ज ड द ग ब (३) ख च ठ प श (४) ङ ञ ण न म

(iii) ऋ කාරයෙහි වෘද්ධි ස්වභාවය වන්නේ

(१) ऋ (२) अर् (३) औ (४) आर्

(iv) පඤ්චමී විභක්ති ප්‍රයෝගයකි.

(1) කරණාර්ථය (2) අපාදානාර්ථය (3) ආධාරාර්ථය (4) උක්තාර්ථය

(v) අනද්‍යතනාතීත ලඞ් ලකාර පදයකි.

(१) गत्वा (२) वक्तुं (३) पिबति (४) अभवत्

(vi) " पित्रा " යනු पितृ ශබ්දයේ

(1)ප්‍රථමා ඒකවචනය යි. (2)පඤ්චමී ද්විවචනය යි. (3)තෘතීයා ඒකවචනය යි. (4)ෂෂ්ඨී බහුවචනය යි.

(vii) ලංකාවේ රජ කළ කුමාරදාස රජු විසින් රචිත "ජානකීහරණය"

(1) ශතක කාව්‍යයකි. (2) දෘෂ්‍ය කාව්‍යයකි. (3) උපදේශ කාව්‍යයකි. (4) මහා කාව්‍යයකි.

(viii) මූර්ධජ අකුරු පමණක් අයත් පේළිය කුමක් ද?

(१) उ ई म आ र स (२) ण ठ ष र ड (३) इ च छ ज झ श (४) अ इ उ ऋ ऌ

(ix) अति + अवश्य යන්නෙහි සන්ධි පදය වන්නේ

(१) अतिवश्य (२) अत्यावश्य (३) अत्यवश्य (४) अत्यवाश्य

(x) " प्रजासु मातेव हितप्रवृत्ता गुरौ जने भक्तिरिवानुवृत्ता ।
लक्ष्मीरिवाधीशकुले कृताभा जनत्यभूदुत्तमदेवता या ॥ " මෙයින් වර්ණනා කරන්නේ

(1) සුද්දෝධන රජු. (2) මහා ප්‍රජාපතී දේවිය. (3) මහාමායා දේවිය. (4) සිදුහත් කුමරු.

(ලකුණු 4 X 10 = 40)

## II කොටස.

**2.** (i) පහත දැක්වෙන වාක්‍ය සිංහලයට නගන්න.

१ अथ भवान् किं वक्तुमनाः।

२ चिर कालं श्रुतो मया तवापवादम्।

३ ततो राजा गजावलोकनाय बहिरगमत्। (ලකුණු 2 X 3 = 06 යි)

(ii) පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට නගා දේව නාගරී අකුරින් ලියන්න.

1. ශිෂ්‍යයා විලේ නෙළුම් බලයි.

2. ඔහු නැගිට රජුට වැඳ කීවේ ය.

3. මම බොහෝ භික්ෂූන් සමඟ ඉගෙනගනිමි. (ලකුණු 3 X 3 = 09 යි)

**3.** (i) √**नम्** ධාතුව පහත අර්ථ ලැබෙන සේ වරනගා දක්වන්න.

| ධාතුව | අර්ථය | පදය |
|---|---|---|
| नम् | නමදිති | |
| | නමදිමි | |
| | නමදිහු | |
| | නමදීවා | |
| | නැමදුවේ ය | |

(ලකුණු 1½ X 5 = 7 ½ යි)

(ii) පහත ශබ්ද, දක්වා ඇති අර්ථ ලැබෙන සේ වරනගා දක්වන්න.

| ශබ්ද | අර්ථය | පදය |
|---|---|---|
| गुरु | ගුරුවරයා විසින් | |
| आपन | ආපන ශාලාවේ | |
| नेतृ | නායකයා පිණිස/නායකයාට | |
| लता | වැල්වලින් | |
| श्वन् | බල්ලෝ | |

(ලකුණු 1½ X 5 = 7 ½ යි)

**4.** පහත සඳහන් පාඨය සිංහලයට නගන්න.

राजा च तदर्थं ज्ञात्वा शय्यातो भूमौ पपात। ततश्च देवीकरकमलचालितचेलाञ्चलानिलेन ससंज्ञो भूत्वा 'देवी, मा मां स्पृश हा हा पुत्रघातिनम् इति विलपन्कुरर इव द्वारपालानानाय्य 'ब्राह्मणानानयत' इत्याह। ततः स्वाज्ञया समागतान्ब्राह्मणान्नत्वा 'मया पुत्रो हतः' तस्य प्रायश्चित्तं वदध्वम्' इति वदन्तं ते तमूचुः -- 'राजन्, सहसा वह्निमाविश' इति। ततः समेत्य बुद्धिसागरः प्राह -- 'यथा त्वं राजाधमः, तथैवामात्याधमो वत्सराजः। तव किल राज्यं दत्वा सिन्धुलनृपेणतेनत्वदुत्सङ्गे भोजः स्थापितः।

(ලකුණු 15 යි)

**5.** පහත දැක්වෙන පද්‍ය සිංහල ගද්‍යයට නගන්න.

स्वल्पान्तरं यस्य वपुर्मुनेः स्याद्वह्न्यद्भुतं यस्य च जन्म दीप्तं ।
यस्योत्तमं भाविनमात्य चार्थं तं प्रेक्ष्य कस्मात्तव धीर बाष्पः ॥ ६८ ॥

अपि स्थिरायुर्भगवन् कुमारः कश्चिन्न शोकाय मम प्रसूतः ।
लब्धः कथंचित्सलिलांजलिर्मे न खल्विमं पातुमुपैति कालः ॥ ६९ ॥

अप्यक्षयं मे यशसो निधानं कच्चिद्ध्रुवो मे कुलहस्तसारः ।
अपि प्रयास्यामि सुखं परत्र सुप्तेऽपि पुत्रेऽनिमिषैकचक्षुः ॥ ७० ॥

--- बुद्ध चरिते । (ලකුණු 15 යි)

**6.** (i) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කොට දක්වන්න.

१. महा + इन्द्रः । २. अमात्य + अंश । ३. जाति + अन्धः । ४. सम्यक् + उत्तमम् । ५. प्रथमः + सर्गः ।

(ii) පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කොට දක්වන්න.

१. किमस्ति । २. अहोरात्रम् । ३. देवालय । ४. पुनरपि । ५. तन्न ।

(iii) පහත පදවල උපසර්ග වෙන්කොට දක්වන්න.

१. सम्भावना २. जनाधिपति ३. निरामिष ४. प्रत्यावलोकन ५. विहरति (ලකුණු 15 යි)

**7.** පහත දැක්වෙන සාරස්වත සූත්‍ර සනිදර්ශනව පැහැදිලි කරන්න.

१. मोनुस्वारः ।
२. रि लोपो दीर्घश्च ।
३. हसा व्यञ्जनानि । (ලකුණු 5 X 3 = 15 යි)

**8.** භෝජ රජු රාජ්‍යත්වයට පත් වූ අයුරු භෝජ ප්‍රබන්ධය ඇසුරින් දක්වන්න.

**නැතහොත්**

කපිලවස්තුපුර පිළිබඳ බුද්ධචරිත මහා කාව්‍යයේ දක්වා ඇති තොරතුරු කවරේ ද?

(ලකුණු 15 යි)

* * *